දිනමිණ - 2020/05/29

# රාජ්‍ය දැව සංස්ථාව

## පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය

## නවක කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම
## 2020 වර්ෂය - දැව සැපයීම්

2020 වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු රජයේ ආයතන විසින් රාජ්‍ය දැව සංස්ථාව වෙත නිදහස් කරනු ලබන වනවගා, අනතුරුදායක හා සංවර්ධන යෝජනා ක්‍රම වැනි වෙනත් අවශ්‍යතාවයන් මත ඉවත් කිරීමට තීරණය කරන ලද ගස් කපා හෙලා පවත්නා චක්‍රලේඛන හා නීතිරීතීන්ට යටත්ව සංස්ථාව විසින් නියම කරන ලද ගබඩා හා නිෂ්පාදන සංකීර්ණ වෙත සපයා භාරදීම හා සංස්ථාව නියම කරනු ලබන දැව පමණක් මිලදී ගැනීමට කැමැත්තක් දක්වන පුද්ගලයින් රාජ්‍ය දැව සංස්ථාවේ දැව සැපයීම් කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

ලියාපදිංචිය පිළිබඳ වැඩි විස්තර අපගේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ පහත සඳහන් ප්‍රාදේශීය කාර්යාලයන්ගෙන් හෝ www.timco.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැක.

| කාර්යාලය | ලිපිනය | දුරකථන අංක |
|---|---|---|
| මෙහෙයුම් අංශය | රාජ්‍ය දැව සංස්ථාව, 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල | 011-2885854 |
| අනුරාධපුරය | රාජ්‍ය දැව සංස්ථාව, ගොඩගේ මාවත, අනුරාධපුරය | 025-2222380 |
| අම්පාර | රාජ්‍ය දැව සංස්ථාව, එරගම පාර, අම්පාර | 063-2222413 |
| කුරුණෑගල | රාජ්‍ය දැව සංස්ථාව, පොල්අත්තාපිටිය, කුරුණෑගල | 037-2222456 |
| කොළඹ | රාජ්‍ය දැව සංස්ථාව, කල්දෙමුල්ල | 011-2637179 |
| මහනුවර | රාජ්‍ය දැව සංස්ථාව, පල්ලෙකැලේ, මහනුවර | 081-2421717 |
| පොළොන්නරුව | රාජ්‍ය දැව සංස්ථාව, මින්නේරිය | 027-2246287 |
| බණ්ඩාරවෙල | රාජ්‍ය දැව සංස්ථාව, අංක 25, බිඳුණුවැව, බණ්ඩාරවෙල | 057-2232478 |
| රත්නපුරය | රාජ්‍ය දැව සංස්ථාව, නව නගරය, රත්නපුරය | 045-2228948 |
| යාපනය | රාජ්‍ය දැව සංස්ථාව, 25, ගුරුනගර්, යාපනය | 021-2220278 |
| නුවරඑළිය | රාජ්‍ය දැව සංස්ථාව, ලේඩි මැකලම් පාර, නුවරඑළිය | 052-2222533 |
| මාතර | රාජ්‍ය දැව සංස්ථාව, දුම්රිය බඩු ගබඩා පාර, මාතර | 041-2222122 |
| මොණරාගල | රාජ්‍ය දැව සංස්ථාව, හුලංදාව දකුණ පාර, මොණරාගල | 055-2276334 |

**ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම**

- 2020.06.12 වන දින ප.ව. 3.00 දක්වා පමණක් අයදුම්පත් ප්‍රධාන කාර්යාලයෙන් හා ඉහත සඳහන් ප්‍රාදේශීය කාර්යාල මගින් නිකුත් කරනු ලබන අතර, 2020.06.15 දින ප.ව. 3.00 දක්වා පමණක් අයදුම්පත් භාරගනු ලැබේ.
- D ශ්‍රේණිය සඳහා සුදුසුකම් සපුරාලනු ලබන අයදුම්කරුවන් විසින් අයදුම්පත් භාරදීමේ දී රු. 500.00 ක ලියාපදිංචි ගාස්තුවක් ද C හා B ශ්‍රේණීන් සඳහා සුදුසුකම් සපුරාලනු ලබන අයදුම්කරුවන් රු. 2,000.00 ක ලියාපදිංචි ගාස්තුවක් මුදලින් ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශය වෙත ගෙවා ලබාගත් කුවිතාන්සිපත ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් අංශය වෙත ඉදිරිපත් කළයුතු වේ.
- ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන කොන්ත්‍රාත්කරුවන් D,, C හා B යටතේ ශ්‍රේණිගත කරනු ලැබේ. එලෙස ශ්‍රේණිගත කිරීමේදී ඔවුන් සතුව පවතින ස්ථාවර වත්කම්, දැව සැපයීම් සඳහා අවශ්‍ය වන යන්ත්‍රෝපකරණ (දම්වැල් කියත්, ලොරි රථ, ට්‍රැක්ටර්, ක්‍රේන් යන්ත්‍ර යන ආදිය) හා දැව සැපයීම් සම්බන්ධ පළපුරුද්ද සළකා බලනු ඇත.

**සභාපති,**

**රාජ්‍ය දැව සංස්ථාව.**

தகவல் - 2020/05/29

# அரசாங்க மரக் கூட்டுத்தாபனம்

சுற்றாடல் மற்றும் வனசீவராசிகள் வள அமைச்சு

# புதிய ஒப்பந்தக்காரர்களைப் பதிவு செய்தல்
# 2020ஆம் வருடம் – மரங்களை வழங்குதல்

2020ஆம் வருடத்தில் வன பரிபாலனத் திணைக்களம் உட்பட அரச நிறுவனங்களினால் அரசாங்க மரக் கூட்டுத்தாபனத்திற்கு விடுவிக்கப்படும் வனப் பயிர்கள், அபாயகரமான மற்றும் அபிவிருத்தித் திட்டங்கள் போன்ற வேறு தேவைகளின் அடிப்படையில் அப்புறப்படுத்துவதற்கு தீர்மானிக்கப்பட்டுள்ள மரங்களை வெட்டி வீழ்த்தி நடைமுறையிலுள்ள சுற்றுநிருபம் மற்றும் சட்டதிட்டங்களின் கீழ் கூட்டுத்தாபனத்தினால் விதிக்கப்படும் களஞ்சியசாலைகள் மற்றும் உற்பத்தி கட்டிடத் தொகுதிகளுக்கு வழங்கி ஒப்படைத்தல் மற்றும் கூட்டுத்தாபனத்தினால் விதிக்கப்படும் மரத் தொகைகளை கொள்வனவு செய்வதற்கு ஆர்வம் காட்டும் நபர்களை அரசாங்க மரக் கூட்டுத்தாபனத்தில் மரங்களை வழங்கும் ஒப்பந்தக்காரர்களாகப் பதிவு செய்து கொள்வதற்காக விண்ணப்பங்கள் கோரப்படுகின்றன.

பதிவு தொடர்பான மேலதிக விபரங்களை எமது பிரதான அலுவலகத்தில் அல்லது பின்வரும் பிராந்திய அலுவலகங்களிலிருந்து அல்லது www.timco.lk எனும் இணையதளத்திற்குப் பிரவேசித்துப் பெற்றுக்கொள்ளலாம்.

| அலுவலகம் | முகவரி | தொலைபேசி இல. |
|---|---|---|
| செயற்பாட்டுப் பிரிவு | அரசாங்க மரக் கூட்டுத்தாபனம், 82, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல | 011-2885854 |
| அநுராதபுரம் | அரசாங்க மரக் கூட்டுத்தாபனம், கொடகே மாவத்தை, அநுராதபுரம் | 025-2222380 |
| அம்பாறை | அரசாங்க மரக் கூட்டுத்தாபனம், எரகம வீதி, அம்பாறை | 063-2222413 |
| குருநாகல் | அரசாங்க மரக் கூட்டுத்தாபனம், பொல்அத்தாபிட்டிய, குருநாகல் | 037-2222456 |
| கொழும்பு | அரசாங்க மரக் கூட்டுத்தாபனம், கல்தேமுல்ல | 011-2637179 |
| கண்டி | அரசாங்க மரக் கூட்டுத்தாபனம், பல்லேகலை, கண்டி | 081-2421717 |
| பொலன்னறுவை | அரசாங்க மரக் கூட்டுத்தாபனம், மின்னேரிய | 027-2246287 |
| பண்டாரவளை | அரசாங்க மரக் கூட்டுத்தாபனம், இல. 25, பிந்துனுவெவ, பண்டாரவளை | 057-2232478 |
| இரத்தினபுரி | அரசாங்க மரக் கூட்டுத்தாபனம், புதிய நகரம், இரத்தினபுரி | 045-2228948 |
| யாழ்ப்பாணம் | அரசாங்க மரக் கூட்டுத்தாபனம், 25, குரு நகர், யாழ்ப்பாணம் | 021-2220278 |
| நுவரெலியா | அரசாங்க மரக் கூட்டுத்தாபனம், லேடி மெக்கலம் வீதி, நுவரெலியா | 052-2222533 |
| மாத்தறை | அரசாங்க மரக் கூட்டுத்தாபனம், புகையிரதக் களஞ்சியசாலை வீதி, மாத்தறை | 041-2222122 |
| மொனராகலை | அரசாங்க மரக் கூட்டுத்தாபனம், ஹுலங்தாவ தெற்கு வீதி, மொனராகலை | 055-2276334 |

**விண்ணப்பங்களைச் சமர்ப்பித்தல்:**

- 2020-06-12ஆம் திகதி பி.ப. 3.00 மணி வரையில் மாத்திரம் விண்ணப்பப் படிவங்களை பிரதான அலுவலகம் மற்றும் பின்வரும் பிராந்திய அலுவலகங்களினால் வழங்கப்படும் என்பதுடன், 2020-06-15ஆம் திகதி பி.ப. 3.00 மணி வரை மட்டுமே விண்ணப்பப் படிவங்கள் ஏற்றுக்கொள்ளப்படும்.
- D தரத்திற்கான தகைமையைப் பெற்றுள்ள விண்ணப்பதாரர்களால் விண்ணப்பம் ஒப்படைக்கப்படும் போது 500.00 ரூபா பதிவுக் கட்டணத்தையும் மற்றும் C மற்றும் B தரத்திற்கான தகைமையைப் பெற்றுள்ள விண்ணப்பதாரர்கள் 2000.00 ரூபா பதிவுக் கட்டணத்தையும் பிரதான அலுவலகத்தின் கணக்குப் பிரிவிற்குச் செலுத்தி பெற்றுக்கொண்ட பற்றுச்சீட்டை பிரதான அலுவலகத்தின் செயற்பாட்டுப் பிரிவிற்குச் சமர்ப்பித்தல் வேண்டும்.
- பதிவு செய்து கொள்வதற்கு எதிர்பார்க்கும் ஒப்பந்தக்காரர்கள் D, C மற்றும் B என தரப்படுத்தப்படுவர். அவ்வாறு தரப்படுத்தும் போது அவர்கள் வசமுள்ள நிலையான சொத்துகள், மரங்களை வழங்குவதற்குத் தேவையான இயந்திரோபகரணங்கள் (சங்கிலி வாள்கள், லொறிகள், டிராக்டர், கிரேன் இயந்திரங்கள் போன்றன) மற்றும் மரங்களை வழங்குதல் தொடர்பான அனுபவம் கவனத்திற் கொள்ளப்படும்.

**தலைவர்,**
**அரசாங்க மரக் கூட்டுத்தாபனம்.**

රාජ්‍ය දැව සංස්ථාව

පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය

# නවක කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

## 2020 වර්ෂය - දැව සැපයීම්

2020 වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු රජයේ ආයතන විසින් රාජ්‍ය දැව සංස්ථාව වෙත නිදහස් කරනු ලබන වන වගා, අනතුරුදායක හා සංවර්ධන යෝජනා ක්‍රම වැනි වෙනත් අවශ්‍යතාවයන් මත ඉවත් කිරීමට තීරණය කරන ලද ගස් කපා හෙලා පවත්නා චක්‍රලේඛ හා නීති රීතීන්ට යටත්ව සංස්ථාව විසින් නියම කරන ලද ගබඩා හා නිෂ්පාදන සංකීර්ණ වෙත සපයා භාරදීම හා සංස්ථව නියම කරනු ලබන දැව පමණක් මිලදී ගැනීමට කැමැත්තක් දක්වන පුද්ගලයින් රාජ්‍ය දැව සංස්ථාවේ දැව සැපයීම් කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

ලියාපදිංචිය පිළිබඳ වැඩි විස්තර අපගේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ පහත සඳහන් ප්‍රාදේශීය කාර්යාලයන් ගෙන් හෝ www.timco.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැක.

| කාර්යාලය | ලිපිනය | දුරකථන අංක |
|---|---|---|
| මෙහෙයුම් අංශය | රාජ්‍ය දැව සංස්ථාව, 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල | 0112885854 |
| අනුරාධපුර | රාජ්‍ය දැව සංස්ථාව, ගොඩගේ මාවත , අනුරාධපුර | 0252222380 |
| අම්පාර | රාජ්‍ය දැව සංස්ථාව, එරගම පාර, අම්පාර | 0632222413 |
| කුරුණෑගල | රාජ්‍ය දැව සංස්ථාව, පොල්අත්තාපිටිය, කුරුණෑගල | 0372222456 |
| කොළඹ | රාජ්‍ය දැව සංස්ථාව, කල්දෙමුල්ල | 0112637179 |
| මහනුවර | රාජ්‍ය දැව සංස්ථාව, පල්ලේකැලේ, මහනුවර | 0812421717 |
| පොළොන්නරුව | රාජ්‍ය දැව සංස්ථාව, මින්නේරිය | 0272246287 |
| බණ්ඩාරවෙල | රාජ්‍ය දැව සංස්ථාව, අංක 25, බිඳුනුවැව, බණ්ඩාරවෙල. | 0572232478 |
| රත්නපුරය | රාජ්‍ය දැව සංස්ථාව, නව නගරය, රත්නපුර | 0452228948 |
| යාපනය | රාජ්‍ය දැව සංස්ථාව, 25, ගුරුනගර්, යාපනය. | 0212220278 |
| නුවරඑළිය | රාජ්‍ය දැව සංස්ථාව, ලේඩි මැකලම් පාර, නුවරඑළිය | 0522222533 |
| මාතර | රාජ්‍ය දැව සංස්ථාව, දුම්රිය බඩු ගබඩා පාර, මාතර | 0412222122 |
| මොනරාගල | රාජ්‍ය දැව සංස්ථාව, හුලංදාව දකුණ පාර, මොනරාගල | 0552276334 |

**ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම**

- 2020.06.12 වන දින ප.ව.3.00 දක්වා පමණක් අයදුම්පත් ප්‍රධාන කාර්යාලයෙන් හා ඉහත සඳහන් ප්‍රාදේශීය කාර්යාල මඟින් නිකුත් කරනු ලබන අතර 2020.06.15 දින ප.ව. 3.00 දක්වා පමණක් අයදුම්පත් භාරගනු ලැබේ.
- D ශ්‍රේණිය සඳහා සුදුසුකම් සපුරාලනු ලබන අයදුම්කරුවන් විසින් අයදුම්පත් භාරදීමේ දී රු. 500.00ක ලියාපදිංචි ගාස්තුවක් ද C හා B ශ්‍රේණීන් සඳහා සුදුසුකම් සපුරාලනු ලබන අයදුම්කරුවන් රු. 2000.00ක ලියාපදිංචි ගාස්තුවක් මුදලින් ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශය වෙත ගෙවා ලබාගත් කුවිතාන්සිපත ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් අංශය වෙත ඉදිරිපත් කළ යුතු වේ.

ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන කොන්ත්‍රාත්කරුවන් D, C හා B යටතේ ශ්‍රේණිගත කරනු ලැබේ. එලෙස ශ්‍රේණිගත කිරීමේදී ඔවුන් සතුව පවතින ස්ථාවර වත්කම් දැව සැපයීම් සඳහා අවශ්‍ය වන යන්ත්‍රෝපකරණ (දම්වැල් කියත්, ලොරි රථ, ට්‍රැක්ටර්, ක්‍රේන් යන්ත්‍ර යන ආදිය) හා දැව සැපයීම් සම්බන්ධ පළපුරුද්ද සලකා බලනු ඇත.

**සභාපති**
**රාජ්‍ය දැව සංස්ථාව.**

# දැව සැපයීමේ කොන්ත්‍රාත්කරුවන් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය යාවත්කාලීන කිරීම.

ඉහත කාර්යය සඳහා ඔබ විසින් පත් කරන ලද මෙහි පහත අත්සන් කරනු ලබන කමිටුව 2019.12.13 දින පෙ.ව. 9.30 ට ප්‍රධාන කාර්යාලයට රැස්ව පහත සඳහන් පරිදි නිර්දේශ ඉදිරිපත් කර ඇත.

රාජ්‍ය දැව සංස්ථාවේ කොන්ත්‍රාත්කරුවන් පහත සඳහන් ශ්‍රේණි 05ක් යටතේ ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ.

1. D ශ්‍රේණිය
2. C ශ්‍රේණිය
3. B ශ්‍රේණිය
4. A ශ්‍රේණිය
5. Sp (විශේෂ) ශ්‍රේණිය

## 01. D ශ්‍රේණිය

### අ. D ශ්‍රේණියේ පළමු ලියාපදිංචිය

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් D ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි කිරීම නිර්දේශ කරමු.

I. ලක්ෂය (රු. 100,000/-) කට නොඅඩු වටිනාකමකට ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබාගත් වත්කම් සහතිකයක්/ ආදායම් වාර්තා හෝ අදායම් බදු ගෙවනු ලබන බවට වූ කුවිතාන්සිපත ඉදිරිපත් කිරීම.

II. බලපත්‍ර සහිත දම්වැල් කියතක් තමා සන්තකයේ ඇති බව සනාථ කරන ලියවිලි ඉදිරිපත් කිරීම.

III. ජොෂ්ඨ ප්‍රාදේශීය කළමනාකාර / ප්‍රාදේශීය කළමනාකාරගේ ලියාපදිංචි කිරීමේ නිර්දේශය.

### ආ. D ශ්‍රේණියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් C ශ්‍රේණිය දක්වා උසස් කිරීම

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් C ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවන් ලෙස උසස් කිරීම නිර්දේශ කරමු.

i. ලක්ෂ පහ (රු. 500,000/-) කට නොඅඩු වටිනාකමකට ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබාගත් වත්කම් සහතිකයක්/ ආදායම් වාර්තා හෝ අදායම් බදු ගෙවනු ලබන බවට වූ කුවිතාන්සි පත ඉදිරිපත් කිරීම.

121



ii. අඛණ්ඩව වසර 01 ක දැව සැපයීම් සේවා කාලයක් සපුරා තිබීම හා පවත්නා වසරේ ලක්ෂ 25 (රු.2,500,000/-) ක දැව සැපයීම් වටිනාකමක් සපුරා තිබීම.

iii. බලපත්‍ර සහිත දම්වැල් කියත් 02ක් තමා සන්තකයේ හෝ කලත්‍රයා සන්තකයේ පවතින බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කිරීම.

iv. ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය කළමනාකාර / ප්‍රාදේශීය කළමනාකාරගේ ශ්‍රේණිය උසස් කිරීමේ නිර්දේශය.

02. <u>C ශ්‍රේණිය</u>

අ. **C ශ්‍රේණියේ පළමු ලියාපදිංචිය**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් C ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි කිරීම නිර්දේශ කරමු.

i. දස ලක්ෂය (රු. 1,000,000/-) කට නොඅඩු වටිනාකමකට ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබාගත් වත්කම් සහතිකයක්/ ආදායම් වාර්තා හෝ අදායම් බදු ගෙවනු ලබන බවට වූ කුවිතාන්සිපත ඉදිරිපත් කිරීම.

ii. බලපත්‍ර සහිත දම්වැල් කියත් 02ක් තමා සන්තකයේ හෝ කලත්‍රයා සන්තකයේ පවතින බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කිරීම.

iii. ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය කළමනාකාර / ප්‍රාදේශීය කළමනාකාරගේ ලියාපදිංචි කිරීමේ නිර්දේශය.

ආ. **C ශ්‍රේණියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් B ශ්‍රේණිය දක්වා උසස් කිරීම**

i. අඛණ්ඩව වසර 02 ක දැව සැපයීම් සේවා කාලයක් සපුරා තිබීම හා පවත්නා වසරේ ලක්ෂ 50 ක (රු.5,000,000/- ) දැව සැපයීම් වටිනාකමක් සපුරා තිබීම.

ii. බලපත්‍ර සහිත දම්වැල් කියත් 03ක් තමා සන්තකයේ හෝ කලත්‍රයා සන්තකයේ පවතින බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කිරීම.

iii. ලොරියක් හා ට්‍රැක්ටර්/ බූම්ට්‍රක්/ ක්‍රේන් යන්ත්‍ර/ ටිම්බර්ජැක් යන යන්ත්‍ර වලින් එකක් තම සන්තකයේ තිබීම හෝ කලත්‍රයා සන්තකයේ තිබෙන බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කිරීම.

iv. ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය කළමනාකාර / ප්‍රාදේශීය කළමනාකාරගේ ශ්‍රේණිය උසස් කිරීමේ නිර්දේශය.

## 03. B ශ්‍රේණිය

### අ. B ශ්‍රේණියේ පළමු ලියාපදිංචිය

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් B ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි කිරීම නිර්දේශ කරමු.

i. ලක්ෂ 15 (රු. 1,500,000/-) කට නොඅඩු වටිනාකමකට ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබාගත් වත්කම් සහතිකයක්/ ආදායම් වාර්තා හෝ අදායම් බදු ගෙවනු ලබන බවට වූ කුවිතාන්සිපත ඉදිරිපත් කිරීම.

ii. බලපත්‍ර සහිත දම්වැල් කියත් 03ක් තමා සන්තකයේ හෝ කලත්‍රයා සන්තකයේ පවතින බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කිරීම.

iii. ලොරියක් **හා** ට්‍රැක්ටර්/ බූම්ට්‍රක්/ ක්‍රේන් යන්ත්‍ර/ ටිම්බර්ජැක් යන යන්ත්‍ර වලින් එකක් තම සන්තකයේ තිබීම හෝ කලත්‍රයා සන්තකයේ තිබෙන බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කිරීම.

iv. ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය කළමනාකාර / ප්‍රාදේශීය කළමනාකාරගේ ලියාපදිංචි කිරීමේ නිර්දේශය

<u>සැළකිය යුතුය :</u>

ඉහත ලියාපදිංචියේ දී ජංගම ඉරුම්හලක් තම සන්තකයේ හෝ කලත්‍රයා සන්තකයේ ඇති බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කර ඇත්නම්, සිල්පර වැඩබිමක් පැවරීමට සුදුසුකමක් වනු ඇත.

### ආ B ශ්‍රේණියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් A ශ්‍රේණියට උසස් කිරීම.

i. අඛණ්ඩව වසර 02 ක දැව සැපයීම් සේවා කාලයක් සපුරා තිබීම හා පසුගිය වසරේ ලක්ෂ 100 ක (රු.10,000,000/- ) දැව සැපයීම් වටිනාකමක් සපුරා තිබීම.

ii. බලපත්‍ර සහිත දම්වැල් කියත් 04ක් තමා සන්තකයේ හෝ කලත්‍රයා සන්තකයේ පවතින බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කිරීම.

iii. ලොරි 02ක් **හා** ට්‍රැක්ටර්/ බූම්ට්‍රක්/ ක්‍රේන් යන්ත්‍ර/ ටිම්බර්ජැක් යන යන්ත්‍ර වලින් 02ක් තම සන්තකයේ තිබීම හෝ කලත්‍රයා සන්තකයේ තිබෙන බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කිරීම.

119

iv. ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය කළමනාකාර / ප්‍රාදේශීය කළමනාකාරගේ උසස් කිරීමේ නිර්දේශය.

## 04. A ශ්‍රේණිය

### අ. A ශ්‍රේණිය යටතේ පළමු ලියාපදිංචිය

පළමු ලියාපදිංචිය මෙම ශ්‍රේණිය යටතේ සිදු නොකෙරේ. B ශ්‍රේණිය යටතේ ලියාපදිංචි වී සිට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් A ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි කිරීම නිර්දේශ කරමු.

i. අඛණ්ඩව වසර 02 ක දැව සැපයීම් සේවා කාලයක් සපුරා තිබීම හා පවත්නා වසරේ ලක්ෂ 100 ක (රු.10,000,000/- ) දැව සැපයීම් වටිනාකමක් සපුරා තිබීම.

ii. බලපත්‍ර සහිත දම්වැල් කියත් 04ක් තමා සන්තකයේ හෝ කලත්‍රයා සන්තකයේ පවතින බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කිරීම.

iii. ලොරි 02ක් **හා** ට්‍රැක්ටර්/ බූම්ට්‍රක්/ ක්‍රේන් යන්ත්‍ර/ ටිම්බර්ජැක් යන යන්ත්‍ර වලින් 02ක් තම සන්තකයේ තිබීම හෝ කලත්‍රයා සන්තකයේ තිබෙන බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කිරීම.

iv. ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය කළමනාකාර / ප්‍රාදේශීය කළමනාකාරගේ ශ්‍රේණිය උසස් කිරීමේ නිර්දේශය.

**සැළකිය යුතුය :**

ජංගම ඉරුම්හල් තම සන්තකයේ හෝ කලත්‍රයා සන්තකයේ පවතින ප්‍රමාණය අනුව, සිල්පර වැඩබිම් 02ක උපරිමයට යටත්ව වැඩබිම් පැවරීමට සුදුසුකමක් වනු ඇත.

### ආ A ශ්‍රේණියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් Sp (විශේෂ) ශ්‍රේණියට උසස් කිරීම.

i. අඛණ්ඩව වසර 04 ක දැව සැපයීම් සේවා කාලයක් සපුරා තිබීම හා පෙර වර්ෂ 02ක කාල සීමාවක් තුළ ලක්ෂ 200 ක (රු.20,000,000/- ) දැව සැපයීම් වටිනාකමක් සපුරා තිබීම.

ii. බලපත්‍ර සහිත දම්වැල් කියත් 04ක් තමා සන්තකයේ හෝ කලත්‍රයා සන්තකයේ පවතින බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කිරීම.

iii. ලොරි 03ක් **හා** ට්‍රැක්ටර්/ බූම්ට්‍රක්/ ක්‍රේන් යන්ත්‍ර/ ටිම්බර්ජැක් යන යන්ත්‍ර වලින් 03ක් තම සන්තකයේ තිබීම හෝ කලත්‍රයා සන්තකයේ තිබෙන බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කිරීම.

iv. බැකෝ යන්ත්‍ර, ඩෝසර්, වින්ච්, ට්‍රැක්ටර් යන යන්ත්‍ර තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

v. ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය කළමනාකාර / ප්‍රාදේශීය කළමනාකාරගේ ශ්‍රේණිය උසස් කිරීමේ නිර්දේශය.

05. <u>විශේෂ ශ්‍රේණිය</u>

අ. **Sp (විශේෂ) ශ්‍රේණිය යටතේ පළමු ලියාපදිංචිය**

පළමු ලියාපදිංචිය මෙම ශ්‍රේණිය යටතේ සිදු නොකෙරේ. A ශ්‍රේණිය ලෙස ලියාපදිංචි වී සිට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති කොන්ත්‍රාත්කරුවන් Sp (විශේෂ) ශ්‍රේණියට ලියාපදිංචි කිරීම නිර්දේශ කරමු.

i. අඛණ්ඩව වසර 04 ක දැව සැපයීම් සේවා කාලයක් සපුරා තිබීම හා පෙර වර්ෂ 02ක කාල සීමාවක් තුළ ලක්ෂ 200 ක (රු.20,000,000/- ) දැව සැපයීම් වටිනාකමක් සපුරා තිබීම.

ii. බලපත්‍ර සහිත දම්වැල් කියත් 04ක් තමා සන්තකයේ හෝ කලත්‍රයා සන්තකයේ පවතින බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කිරීම.

iii. ලොරි 03ක් **හා** ට්‍රැක්ටර්/ බූම්ට්‍රක්/ ක්‍රේන් යන්ත්‍ර/ ටිම්බර්ජැක් යන යන්ත්‍ර වලින් 03ක් තම සන්තකයේ තිබීම හෝ කලත්‍රයා සන්තකයේ තිබෙන බව සනාථ කරන ලියකියවිලි ඉදිරිපත් කිරීම.

iv. බැකෝ යන්ත්‍ර, ඩෝසර්, වින්ච්, ට්‍රැක්ටර් යන යන්ත්‍ර තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

v. ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය කළමනාකාර / ප්‍රාදේශීය කළමනාකාරගේ ශ්‍රේණිය උසස් කිරීමේ නිර්දේශය

<u>සැළකිය යුතුය :</u>

විශේෂ ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවන්ට තම සන්තකයේ හෝ කලත්‍රයා සන්තකයේ පවතින ජංගම ඉරුම්හල් ප්‍රමාණය අනුව, සිල්පර වැඩබිම් 03ක උපරිමයට යටත්ව වැඩබිම් පැවරීම සුදුසුකමක් වනු ඇත.

**ඉහත කරුණු මත ශ්‍රේණිගත කිරීමේදී පහත කරුණු සම්බන්ධ සැළකිලිමත් විය යුතු බවද දන්වමි.**

i. නව ලියාපදංචි වීමකදී හා ශ්‍රේණි උසස් කිරීමේදී තම කලත්‍රයා ද දැව සැපයීම් කොන්ත්‍රාත්තු වශයෙන් ලියාපදිංචි වී ඇති අවස්ථාවක කලත්‍රයා සන්තකයේ පවතින වාහන, යන්ත්‍රසූත්‍ර ඉදිරිපත් කිරීම නොපිළිගනු ඇත.

ii. සියළුම කොන්ත්‍රාත්කරුවන් ශ්‍රේණිය පවත්වාගෙන යෑම පිළිබඳව වර්ෂ 03 කට වරක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) ගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් මගින් ඇගැයීම් කරන අතර, එම අවස්ථාවේ පවතින සුදුසුකම් අනුව, ශ්‍රේණිය තීරණය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| එම්.සී. දේවේන්ද්‍ර | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) | ................................ |
| එච්.බී. රජවත්ත | - | සහකාර සාමාන්‍යාධිකාරී (කලාප i) | ................................ |
| පී.කේ. අජිත් චන්දන | - | සහකාර සාමාන්‍යාධිකාරී (කලාප ii) | ................................ |
| ආර්. විජේතුංග | - | කළමනාකාර (පරිත්‍යාග හා වන අපරාධ) | ................................ |
| බී.ඒ.නලින් දේශප්‍රිය | - | නියෝජ්‍ය කළමනාකාර (දැව සැපයීම්) | ................................ |